සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර් සහ,
අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත,

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

**උපලේඛනගත රජයේ නිලධරයන්ගේ සේවයේ අධිකරණ කළමනාකරණ සහකාර සේවයේ අධිකරණ ලිපිකරු III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2022**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2274/29 සහ 2022.04.08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය - සංශෝධන අංක 01 මඟින් උපලේඛනගත රජයේ නිලධරයන් පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයට සිදුකරන ලද සංශෝධන ප්‍රකාරව ඉහත විභාගය සඳහා අයදුම්පත්‍ර කැඳවමින් නිකුත් කරන ලද 2022.03.04 දිනැති නිවේදනයේ 5 (ඇ) ඡේදය යටතේ සඳහන් සුදුසුකම් පහත සඳහන් පරිදි සංශෝධනය කිරීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

02. ඒ අනුව 2022.03.04 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

I. 05 (ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සිංහල/දෙමළ භාෂාව, ගණිතය ඇතුළු විෂයයන් හයකින් (06) **දෙවරකට නොවැඩි වාර ගණනකදී** සමත්ව ඉන් සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් තුනකට (03) සම්මාන සාමාර්ථ ලබා තිබීම.

II. 2022.03.04 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ 5 ඡේදය යටතේ සඳහන් තනතුරට අදාළ සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය **2022.04.08** ලෙස සංශෝධනය විය යුතුය.

03. ඉහත සංශෝධන වලට අනුව සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ට අයදුම් කිරීමට අවස්ථාව සැලසීම සඳහා අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2022.05.20** ලෙස සංශෝධනය කරනු ලැබේ.

04. ඉහත 02 සහ 03 ඡේදයන්හි සඳහන් සංශෝධනයන්ට යටත්ව ඉහත විභාගය සඳහා අයදුම්පත්‍ර කැඳවීමේ 2022.03.04 දිනැති නිවේදනයේ සඳහන් අනෙකුත් සියළුම කරුණු එලෙසම බලපැවැත්වේ.

05. ඉහත විභාගය සඳහා අයදුම්පත්‍ර කැඳවීමේ 2022.03.04 දිනැති නිවේදනය මත පදනම්ව සුදුසුකම් සපුරා ඇති, දැනටමත් ඉහත විභාගය සඳහා අයදුම්පත්‍ර එවා ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත්‍ර එවීම අවශ්‍ය නොවේ.

06. ඉහත 02 ඡේදයේ දැක්වෙන සංශෝධනය ප්‍රකාරව සුදුසුකම් සපුරන අයදුම්කරුවන් 2022.03.04 දිනැති අයදුම්පත් කැඳවීමේ මුල් නිවේදනය යටතේ සුදුසුකම් සපුරා නොතිබියදී අයදුම්පත් ඉදිරිපත් කර තිබුණද ඔවුන් එදිනට සිය සුදුසුකම් සපුරා නොමැති බැවින් ඉහත 02 ඡේදයේ දැක්වෙන සංශෝධනය ප්‍රකාරව නැවත අයදුම්පත් ඉදිරිපත් කළ යුතුවේ.

07. මෙම නිවේදනය ඔබ අධිකරණයේ ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති සියලු නිලධාරීන්ට/ සේවකයන්ට දැන ගැනීමට සලස්වන්න.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

එච්.එස්.සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව

2022 අප්‍රේල් මස 20 වන දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12